# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 ඔක්තෝබර් මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2020.10.07 දින නිකුත් කරන ලදී)**

# අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන)

**(135 වන අධිකාරය වූ) අවම වේතන (ඉන්දියානු කම්කරු) ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

කම්කරු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (135 වන අධිකාරය වූ) අවම වේතන (ඉන්දියානු කම්කරු) ආඥාපනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, වතුවල ළමුන් සේවයේ යෙදවීම පිළිබඳ වූ වයස වැඩි කිරීම ය.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, යම් සේවායෝජකයකු විසින් මාසික සහල් දීමනාව නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහුගේ අදළ වගකීම ළමුන් සම්බන්ධයෙන් පුළුල් කිරීම ය.

***4 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ගැහැණු කම්කරුවන් වෙනුවෙන් අවම වේතන අනුපාතිකයන් ගෙවීම සම්බන්ධයෙන් අදාළ වන ඔවුන්ගේ වයස් සීමාව පුළුල් කිරීම ය.

එල්.ඩී.—ඕ. 34/2018

## (135 වන අධිකාරය වූ) අවම වේතන (ඉන්දියානු කම්කරු) ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2020 අංක දරන අවම වේතන (ඉන්දියානු කම්කරු) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*135 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (135 වන අධිකාරය වූ) අවම වේතන (ඉන්දියානු කම්කරු) ආඥාපනතේ 4 වන වගන්තියේ "අවුරුදු දාහතරක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "අවුරුදු දාහතරක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "අවුරුදු දාහතරක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ "අවම වේතන අනුප්‍රමාණ" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "අවුරුදු පහළොවක්" යන වචන වෙනුවට "අවුරුදු දහසයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**5.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.